# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
# බෞද්ධාලෝක වෙසක් - ශ්‍රී බු.ව. 2566/2022

**<u>විවෘත වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනය සඳහා අයදුම් පත්‍රය (කේවල / ආයතනික/පාසල්)</u>**

**<u>වෙසක් තේමාව -"ආරෝග්‍යා පරමා ලාභා"</u>**

**(අයදුම්කරු කේවල සහ ආයතනික වශයෙන් හඳුනා ගැනීම සඳහා අදාළ නොවන වචනය කපන්න. අයදුම් පත්‍රයෙහි අදාළ වන කොටස පමණක් සම්පූර්ණ කරන්න.)**

**<u>නිර්මාණයේ විස්තර</u>**

1. නිර්මාණයේ උස :----------------------- වට ප්‍රමාණය/ පළල (ගැඹුර)--------------------------දිග -- ----------------
2. අවශ්‍ය කුඩාරමේ මැද උස :--------------- දිග :-------------------- පළල :-----------------(තරඟ කොන්දේසි වල ඇත.)
3. ප්‍රදර්ශන භූමිය තුළ නිර්මානය සවි කිරීමට පැමිණෙන දිනය හා වේලාව - ------------------------------------------
4. ඔබට අවශ්‍ය විදුලි ප්‍රමාණය - ඇම්පියර් -------------------- (සිංගල් ෆ්‍රේස් /ත්‍රි ෆ්‍රේස්-)--------------------------------
5. විදුලි මෝටර් භාවිතය/ විදුලි බුබුළු භාවිතය ---------------------------------------------------------------------------
6. භාවිතා කරන අමුද්‍රව්‍ය --------------------------------------------------------------------------

**<u>කේවල අයදුම්කරුගේ විස්තර</u>**

1. අයදුම්කරුගේ මුල් අකුරු සමඟ නම :---------------------------------------------------------------------------------
2. ලිපිනය :---------------------------------------------------------------------------------------------------
3. ස්ත්‍රී/පුරුෂ භාවය :- ---------------------------------------------------------------------------------------------
4. දුරකථන අංකය : (නිවස) ------------------------------- (ජංගම)-----------------------------------------------
5. ජාතික හැඳුනුම්පත් අංකය :- ----------------------------- (ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අනිවාර්ය වේ.)

**<u>පාසල්/ආයතනික අයදුම්කරුගේ විස්තරය</u> - -----------------**

1 ආයතනයේ නම :- ------------------------------------------------------------------------------------------

2 ලිපිනය : -------------------------------------------------------------------------------------------------

3. දුරකතන අංකය :---------------------------------------------

4. ආයතනය විසින් නම් කොට ඇති කණ්ඩායම් නියෝජිතයාගේ මුලකුරු සමඟ නම :-

-------------------------------------------------------------------------------------------------------------

5. දුරකතන අංකය :- නිවස ----------------------------------------------- (ජංගම) ----------------------------------

6 ජාතික හැඳුනුම් පත් අංකය : -------------------------------------------------------------------------------

7. ඉහත නියෝජිතයා හැරෙන්නට පණිවුඩ ලබා දිය හැකි වෙනත් අයෙකුගේ නම :-

-------------------------------------------------------------------------------------------------------------

8. දුරකතන අංකය :- නිවස ----------------------------------------------- (ජංගම) ----------------------------------

(පාසල් සහ ආයතනය වෙනුවෙන් ඉදිරිපත්වන්නන්ගේ නාම ලේඛනයක් ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව මෙයට අමුණා එවීමට පියවර ගතයුතු අතර, එම ලේඛනය ප්‍රදර්ශනය පැවැත්වීමට ප්‍රථම අවශ්‍ය වන්නේ නම් සංශෝධනය කළහැක.)

මෙහි පසු පිටෙහි සඳහන් තරඟ කොන්දේසි හොඳින් කියවා තේරුම් ගත් බවත්, මා/අප සඳහන් කළ තොරතුරු නිවැරදි බවටත් විනිශ්චය මණ්ඩලය ලබා දෙන තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවටත් සහතික කොට පහත අත්සන් තබමි/තබමු.

-- දිනය --------------------- ---------------------------------------------------------------------

කේවල අයදුම්කරුගේ අත්සන /ආයතනික/පාසල් නියෝජිතයාගේ අත්සන

**<u>පාසල් සහ ආයතන කණ්ඩායම් සඳහා සහතික කිරීම</u>**

ඉහත ආයතනය නියෝජනය කරමින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :- ......................................... නිලමුද්‍රාව හා දිනය -...................................................

තනතුර, නම හා ලිපිනය :- ...............................................................................................................

# බෞද්ධාලෝක වෙසක් - ශ්‍රී බු.ව. 2566/2022
# වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනය (විවෘත)
# කේවල/ආයතන/පාසල්

***වෙසක් තේමාව - "ආරෝග්‍යා පරමා ලාභා"***

**ඇගයීමේ පදනම මත වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනයට ඉදිරිපත් වන්නන් සඳහා වන උපදෙස්, තොරතුරු සහ නීතිරීති**

1. ඔබගේ නිර්මාණය අර්ථාන්විත වෙසක් පහන් කූඩුවක් විය යුතු අතරම, එහි අවමය දිගින් සහ පළලින් අඩි තුන (03) ක් ද, අවම උස අඩි හතර (04) කට ද නොඅඩු වූ නිර්මාණයක් විය යුතුය.

   බෞද්ධාලෝක වෙසක් කමිටුව මගින් ප්‍රදර්ශන භූමිය තුළ කූඩාරම් ලබා දීමේදී උපරිම මැද උස අඩි හත (07') හෝ අඩි දහතුන (13') හෝ අඩි දහඅට (18') ලෙස ලබා ගත හැකි අතර, එහි වට ප්‍රමාණය අඩි අට (08') ක් නොඉක්මම විය යුතු ලෙස නිර්මාණය කර තිබිය යුතුය.

   නමුත් නිර්මාණයේ ස්වභාවය අනුව කලින් ඉල්ලුම් කර වෙසක් කමිටුවෙන් ලබා ගත් විශේෂ අවසරයක් මත පමණක් මෙම උස, පළල හෝ දිග වට ප්‍රමාණයන් වැඩි කර කූඩාරම සකස් කරවා ගත හැක. (අවශ්‍ය කූඩාරම් ප්‍රමාණය අප්‍රේල් මස 25 වැනි දින වන විට සම්මේලනයට ලිඛිතව දැනුවත් කළයුතුය.)

   මීට පෙර බෞද්ධාලෝක  වෙසක් කලාපයෙහි තරඟ අවස්ථාවන් සඳහා ඉදිරිපත් කළ වෙසක් පහන් කූඩු ඉදිරිපත් නොකරන ලෙස දන්වා සිටිමු.

2. පොලිතින්, රිජිෆෝම්, ප්ලාස්ටික් වැනි පරිසර දූෂක ද්‍රව්‍ය හැර කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය යොදා ගැනීමේ හැකියාව ඇත. මෙය විවෘත ප්‍රදර්ශනයක් ලෙස සංවිධානය කොට විනිශ්චය කටයුතු සිදු කරනු ඇත.

   විනිශ්චය කටයුතු සිදු කිරීමේදී නිර්මාණයේ ආලෝකකරණය, සංකල්පය හා තාක්ෂණය, නිර්මාණකරණය හා එහි ගුණාත්මකභාවය, නිමාව හා ඉදිරිපත් කිරීම මෙන්ම පසුතලය සකස් වන ආකාරය පිළිබඳව හා වෙනත් විශේෂතා පිළිබඳව ද සැළකිල්ලට ගනු ඇත.

   ඔබගේ නිර්මාණය අර්ථාන්විත වෙසක් පහන් කූඩුවක් විය යුතු අතර එසේ නොවන අනෙකුත් වෙසක් නිර්මාණ වෙනම ම ප්‍රභේදයක් යටතේ විනිශ්චය කිරීමට කටයුතු කරනු ඇත.

   අයදුම් පත සමග වෙසක් පහන් කූඩුවේ ස්වභාවය උස හා පළල ඉතා හොඳින් නිරූපනය වන පරිදි රූප සටහනක් සමග පහන් කූඩුව පිළිබඳ විස්තරයක් ලබා දීම අනිවාර්ය වන අතර, එම සැළැස්මේ රහස්‍යභාවය රැකීමට කමිටුව වගබලා ගනු ඇත. එම විස්තර තුළ නිර්මාණයේ උපරිම උස සහ පළල සඳහන් කර තිබීමත්, එම රූප සටහනට අනුකූලව නිර්මාණය ඉදිරිපත් කිරීමේ වගකීම ද නිර්මාණකරුගේ යුතුකම වෙයි.

3. නිර්මාණය මෙන්ම නිර්මාණය ප්‍රදර්ශනය කරන කුටිය ද වෙසක් තේමාවට අනුගත වන අයුරින් සහ නිර්මාණයට සුදුසු පරිදි අලංකාරව තැබීම පිළිබඳව ද තරගකරු සැළකිලිමත් විය යුතුය. මෙය තරඟ විනිශ්චයේදී සලකා බලනු ඇත.

4. බෞද්ධාලෝක වෙසක් කමිටුව ලබා දෙන කුටිය තුළදී ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය විදුලි බුබුළු සහ උපාංග සියල්ල තමා විසින් සපයා ගත යුතු අතර, ඒවායේ ආරක්ෂාව පිළිබඳව ද වගබලා ගැනීම තරගකරුගේ/තරගකරුවන්ගේ වගකීමක් ලෙස සැළකේ.

   ඔබට අවශ්‍ය විදුලි බලය පිළිබඳව දින 10 කට පෙර අප හට දැනුම් දිය යුතු අතර, එය අයදුම්පතෙහිද සඳහන් කල යුතුය. එසේම භාවිතා කරන විදුලි බුබුළු විස්තර සහ විදුලි මෝටර් පිළිබඳ දැනුවත් කළයුතුය. (ඔබ හැකිතාක් විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කළහැකි විදුලි බුබුළු සහ විදුලි මෝටර් පමණක් භාවිතා කිරීමට උනන්දු වන්න.)

   ප්‍රදර්ශන කාලය තුළ කුටියක උපරිම වශයෙන් දෙදෙනෙකුට රැඳී සිටීමට අවසර ලැබෙන අතර, ඉටි පන්දම් හෝ පොල්තෙල් පහන් දැල්වීමට අවසර දෙනු නොලැබේ. තම පහන් කූඩු නිර්මාණය සඳහා විදුලි සැපයුම ප්‍රදර්ශන කාල සීමාව තුළදී පමණක් අප විසින් ලබා දෙනු ලබන අතරම, නිර්මාණයේ විදුලි තත් ඇදීම ඉතා නිවැරදිව සිදු කර ඇති බවට තරගකරු/කරුවන් වග බලා ගත යුතුය.

   වෙසක් පහන් කූඩු ප්‍රදර්ශන කුටියේ සිටින ඔබ හෝ ඔබේ  සහායකයන් ප්‍රදර්ශන අවස්ථාවන්හි වෙසක් උළෙලට උචිත සුදු ඇඳුමකින් සැරසී සිටීමට ද, හැසිරීමට ද ආචාරශීලි විය යුතුය. (සම්මේලනය මගින් ලබා දී ඇති නිල ඇඳුම - කේවල අංශය) , පාසල් ළමුන් නම් නිළ ඇඳුමින්ද , ආයතනයක නම් ඔවුන්ගේ නිල ඇඳුමින්ද, සැරසී  තමන්ට අයත් වෙසක් හැඳුනුම් පතද පැලඳ සිටිය යුතුය. ප්‍රදර්ශන පැවැත්වෙන මුළු කාල සීමාව තුළදී තම නිර්මාණය ප්‍රදර්ශනය විය යුතුය.

   එම කාල සීමාව තුළදී දෙදෙනෙකු සඳහා ආහාර සහ පහසුකම් ලබා දීමට බෞද්ධාලෝක වෙසක් කමිටුව කටයුතු යොදා ඇත. එම අවසරපත් ප්‍රදර්ශන කටයුතු ආරම්භයට පෙර කාර්යාලයෙන් ලබා ගැනීමට කටයුතු කිරීම තරගකරුවාගේ වගකීමයි.

   තම නිර්මාණය සමග රැඳී සිටින සහායකයා පිළිබඳව විස්තර කල්වේලා ඇතිව කාර්යාලයට ලබා දීම තරගකරු/තරගකරුවන්ගේ යුතුකමක් වේ.

5. ස්වකීය නිර්මාණයක් තනිවම ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති අතරම, ආයතනික හෝ කණ්ඩායම් වශයෙන් නිර්මාණ ඉදිරිපත් කිරීමේ හැකියාව ද ඇත. එක් නිර්මාණයක් සඳහා අයදුම් පත බැගින් වන පරිදි නිර්මාණ කිහිපයක් සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වේ. සෑම නිර්මාණයක් ඉදිරිපත් කිරීමට පෙර ආයතනය මගින් හඳුන්වා දී ඇති අයදුම් පත පමණක් නිසි පරිදි පුරවා බෞද්ධාලෝක වෙසක් කමිටුව වෙත භාර දිය යුතුය.

   විශේෂ අවසර ලබා ගැනීමකදී හැර නිර්මාණය සඳහා සහභාගි වන කණ්ඩායමක උපරිම සංඛ්‍යාව (07) දෙනෙකුට සීමා කර ඇත. වෙසක් තේමාවට උචිත වන පරිදි වෙසක් පහන් කූඩු ඉදිරිපත් කිරීම කෙරෙහි තරගකරුවන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර විනිශ්ය මණ්ඩලයද ඒ සඳහා අවධානය යොමු කරනු ඇත.

6. විනිශ්චය මණ්ඩලයේ ඇගයීමට ලක්වන සියලුම නිර්මාණ සඳහා මුදල් ත්‍යාග හා සහතික පත්‍ර හිමි වේ.
   බෞද්ධාලෝක වෙසක් කමිටුවේ සහ නිර්මාණයන් විනිශ්චය කරන අයගේ තීරණය අවසාන තීරණය ලෙස සියලුම නිර්මාණකරුවන් පිළිගත යුතු අතර තරඟ කොන්දේසි මතම ඔබගේ සහභාගීත්වය සිදු විය යුතුය.

7. බෞද්ධාලෝක වෙසක් කමිටුවේ සහ විනිශ්චය මණ්ඩලයේ නිර්දේශවලට හා ප්‍රමිතීන්ට අනුකූල නොවන සියලුම නිර්මාණ සඳහා ත්‍යාග සහ ප්‍රසාද ගෙවීම් කිසිවක් ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර, පහත දක්වා ඇති මුදල් ත්‍යාගයන් සහ ස්ථාන ගණන වෙනස් කරලීම සම්මේලනය සතු වන බව සියලුම නිර්මාණකරුවන් පිලි ගත යුතුය.

8. වෙසක් පහන් කූඩු විනිශ්චය ම සිදුවන මැයි 16 සහ 17 දෙදින තුල රාත්‍රී 08.00 සිට මධ්‍යම රාත්‍රිය දක්වා වශයෙන් සිදු කරන අතර එහි කූඩුව හිමි තැනැත්තා කුටිය තුල රැඳී සිටීම අනිවාර්ය වේ.

9. තම නිර්මාණය 2022 මැයි මස 15 වන වෙසක් පෝය දින සවස සිට මැයි මස 16, 17 සහ 18 වෙනි දිනයන් දක්වා සෑම දිනකම සවස 7.00 සිට පසුදා අළුයම 3.00 දක්වා සම්පූර්ණ ප්‍රදර්ශනය සඳහා තැබීම අනිවාර්ය වේ. මැයි මස 14 දින වන විට ඔබට හිමි ස්ථානය අප කාර්යාලයට පැමිණ වෙන් කර ලියාපදිංචිය තහවුරු කර ගත යුතු අතර, සියලුම පහන් කූඩු නිර්මාණ මැයි මස 15 දින මධ්‍යහන 12 වන විට තමන්ට අයත් ස්ථානය වෙත පැමිණ විදුලිය ලබා ගැනීමේ කටයුතු සිදු කර ගතයුතුය. මෙය ඔබගේත් අපගේත් පහසුව උදෙසා වනු ඇත. (ඉන්පසු වෙසක් පහන් කූඩු භාරනොගන්නා බවද දන්වා සිටිනු කැමැත්තෙමු.)

10. සියලුම ප්‍රදර්ශනකරුවන්ගේ නිර්මාණයන් විනිශ්චය කර බෞද්ධාලෝක වෙසක් කමිටුවේ නිර්දේශ මත මතු දැක්වෙන ආකාරයෙන් ත්‍යාග පිරිනමනු ඇත.

11. පාසල් නිර්මාණ සඳහා විශේෂ අවධානයක් අප සම්මේලනය මගින් සිදු කරනු ලැබේ.

- **පහත දැක්වෙන පරිදි කේවල සහ ආයතනික අංශ දෙක සඳහා මුදල් ත්‍යාග පිරිනමනු ඇත.**

| කේවල අංශය | | ආයතනික අංශය | |
|---|---|---|---|
| පළමු ස්ථානය | රු. 150,000/= | පළමු ස්ථානය | රු. 150,000/= |
| දෙවන ස්ථානය | රු. 100,000/= | දෙවන ස්ථානය | රු. 100,000/= |
| තෙවන ස්ථානය | රු. 75,000/= | තෙවන ස්ථානය | රු. 75,000/= |
| සිව්වන ස්ථානය | රු. 50,000/= | | |
| පස්වන ස්ථානය | රු. 40,000/= | කුසලතා සම්මාන ඇගයීම් | රු. 25,000/= (04 දෙනෙකු සඳහා) |

කුසලතා ඇගයීම් රු. 25,000/= ( 06 දෙනෙකු සඳහා)

ජයග්‍රහණය නොකරන ඇගයීමට ලක්කරන සෑම නිර්මාණයක් සඳහා රු. 7500/= ක මුදල් ත්‍යාගයක් පිරිනමනු ලබන අතර, එම මුදල් ගණන විනිශ්චය මණ්ඩලය සහ සම්මේලනය මගින් තීරණය කරනු ලැබේ.

**පාසල් අයදුම්කරුවන් සඳහා**

| | |
|---|---|
| පළමු ස්ථානය | රු. 60,000/= |
| දෙවන ස්ථානය | රු. 40,000/= |
| තෙවන ස්ථානය | රු. 30,000/= |

කුසලතා ඇගයීම් රු. 20,000/= ( 04 දෙනෙකු සඳහා)

ජයග්‍රහණය නොකරන ඇගයීමට ලක් වන පාසල් සඳහා විනිශ්චය මණ්ඩලයේ නිර්දේශය හා ඇගයීම මත රු. 10,000/- මුදල් ත්‍යාගයක් ලබා දෙනු ඇත.

**සැයු - ප්‍රදර්ශනය අවසන් වන දින රාත්‍රියේ 7.00 ට ප්‍රදර්ශන කලාපය තුළ විශේෂ වේදිකාවක් මත ජයග්‍රහණයට ලක්වන නිර්මාණකරුවන් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කෙරේ. තවද ප්‍රධාන උත්සවය සඳහා ඔබ සහභාගී විය යුත්තේ සුදු ඇඳුමකින් (සම්මේලනය මගින් ලබා දී ඇති නිළ ඇඳුම ) ආයතනික නිල ඇඳුමකින්/ පාසල් නිල ඇඳුමකින් බව සිහිපත් කර සිටිමු.**

- **අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය - 2022 මැයි මස 05 වැනි දින වේ.**

අයදුම්පත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන කාර්යාලය වෙතින් හෝ www.acbc.lk/application/ වෙබ් අඩවියට යොමු වීමෙන් ලබා ගත හැක.

විමසීම් - දිලුම් වාහලතන්ත්‍රී මහතා - **070 5669956 /** චමිල පතිරණ මහතා - **077-7621889**

**ලේකම් - බෞද්ධාලෝක වෙසක්**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය,**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**දු.අංක - 011-2691695/ 2688517**
**විද්යුත් තැපෑල :** acbc380@gmail.com
**වෙබ් අඩවිය -** www.acbc.lk
**ජංගම - 076-5611374** Whatsapp **අංකය - 076-5611374**